# කෙටි විස්තරය

| සැලසුමෙහි විශේෂ ලක්ෂණ | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| **යෝග්‍යතාවය** | • ශ්‍රීලංරුපියල් වලින් හෝ ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ශ්‍රීලංරු 1,000,000/- හෝ ඊට සමාන මුදලක් කාල තැන්පතුවෙහි පවත්වාගෙන යා යුතුවේ<br>• ශ්‍රීලංරුපියල් වලින් හෝ ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ශ්‍රීලංරු 1,000,000/- හෝ ඊට සමාන මුදලක් ඉතුරුම් හෝ ජංගම ගිණුමක පවත්වාගෙන යා යුතුවේ<br>• රු.1,000,000ට වැඩි වටිනාකමක ණය (පුද්ගලික ණය) පහසුකමක් ලබාගන්න<br>• HSBC සමග පවත්වාගෙනයන Advance ගිණුමට රු.125,000ක ට නොවැඩි මාසික වේතනයක් ප්‍රේෂණය කරන්න | • HSBC Advance පිළිගැනීමේ පැකේජය<br><br>• HSBC Advance නීතිරීති සහ කොන්දේසි |
| **HSBC advance ප්‍රතිලාභ සැකෙවින්** | • HSBC Advance වීසා ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පතක් නොමිලේ<br>• HSBC Advance වීසා ප්ලැටිනම් ක්‍රෙඩිට් කාඩ්පතක් සහ දිවයින පුරා ඕනෑම Plus ATM යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීම් නොමිලේ<br>• අයිරා පහසුකම්*<br>• HSBC Advance ජංගම ගිණුමක් සහ ඉතුරුම් ගිණුමක්<br>• ස්ථාවර තැන්පතු මත වරණීය පොළී අනුපාතිකයන්*<br>• බැංකුවේ සැලසුම් සහ සේවා සඳහා වරණීය ගාස්තු අයකිරීම්<br>• සතියේ දින 7 පැය 24 පුරා ඔබ වෙනුවෙන් කැප වූ Advance පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් පහසුකම<br>• සියලුම ශාඛාවන් හි දී ඔබ වෙනුවෙන් ම වෙන් වූ සේවා කවුළු<br>• අන්තර්ජාල බැංකුකරණ හා දුරකථන බැංකුකරණ සේවා නොමිලේ<br>• ක්‍රෙඩිට් කාඩ්පත සඳහා වසර පුරා පිදෙන විශේෂ වරප්‍රසාද<br>• ජාත්‍යන්තර පිළිගැනීම සහ සේවාව<br>• ජාත්‍යන්තර ගිණුම් විවෘත කිරීමේ දී සහය<br>• ලොව පුරා ඕනෑම HSBC ශාඛාවකින් හදිසි මුදල් සේවාව**<br><br>* විස්තර හා නීතිරීති සහ කොන්දේසි සඳහා www.hsbc/lk/advance වෙබ් අඩවිය වෙත පිවිසෙන්න<br>** විනිමය පාලන/නියාමන අවශ්‍යතාවයන්ට විෂය වේ | |

## මූල්‍ය

| | | |
|---|---|---|
| **ශේෂය අවම ශේෂයට වඩා අඩුවීමේ දී වන ගාස්තුව** | • සාමාන්‍ය ශේෂය පවත්වාගෙන නොයන්නේ නම්, **ශ්‍රී ලංකා රුපියල් 1250/ ක ශේෂය අඩුවීමේ මාසික ගාස්තුවක්** අය කෙරෙනු ඇත | • බැංකුවේ ගාස්තු ලේඛනය<br><br>• HSBC Advance නීතිරීති සහ කොන්දේසි<br><br>• HSBC Advance පොදු වෙබ් අඩවිය |
| **ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ගාස්තු** | • මූලික හා ද්විතීක Advance Platinum ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වාර්ෂික ගාස්තු හා සම්බන්ධවීමේ ගාස්තු අය නොකෙරේ | |
| **ATM වෙතින් මුදල් ආපසුගැනීම් සඳහා වන ගාස්තු** | • දේශීය/විදේශීය ශාඛාවල (PLUS) යන්ත්‍ර, වෙනත් දේශීය ATM යන්ත්‍ර වෙතින් සිදුකරන සියලු මුදල් ආපසු ගැනීම් නොමිලේ | |
| **වෙනත් ගාස්තු** | • ගාස්තු අත්හැරීම් පරාසයක් සහ තෝරාගත් බැංකුකරණ සේවාවන් සඳහා වරණීය පිරිනැමීම්. ගාස්තු සහ අයකිරීම් පිළිබඳ විස්තර සඳහා කරුණාකර HSBC වෙබ් අඩවියෙහි හෝ ශාඛාවන්ගෙන් ලබාගත හැකි 'HSBC ගනුදෙනුකරුවන් සඳහා වන [illegible] | |

# HSBC Advance

## කෙටි විස්තරය

| ප්‍රධාන නීති | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| **HSBC Advance සඳහා යෝග්‍යතාවය** | • HSBC Advance සඳහා වන විශේෂ ලක්‍ෂණ සහ ප්‍රතිලාභ භුක්ති විඳීම පිණිස HSBC Advance සඳහා වන යෝග්‍යතා සුදුසුකම් සහ වෙනත් අදාළ නීතිරීති ඔබ විසින් සපුරාලිය යුතු වේ | •සංකලිත ගිණුම් නීතිරීති සහ කොන්දේසි |
| **යෝග්‍යතාවය සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනස් කිරීම** | • ඇතුළත්වීමේ යෝග්‍යතා සුදුසුකම් කලින් කලට වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, එවැනි සංශෝධන පොදු වෙබ් අඩවියෙහි සහ සියලු ශාඛාවන් හි පොදු ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙනු ඇත | |
| **හවුල් ගිණුම්** | • නීතිරීති සහ කොන්දේසි යටතේ අදාළ ගිණුම, සේවා හෝ අන් ආකාරයේ බැඳීම් හා වගකීම් සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන් එකිනෙකා ද සමග හවුල්ව හා වෙන් වෙන් ව ඔබ සියලුදෙනාම බැඳී සිටියි | |
| **ගාස්තු** | • අදාළ අවස්ථාවන් හි දී කලින් කලට සේවා ගාස්තු, පහසුකම් ගාස්තු හෝ වෙනත් ගාස්තු පනවනු ඇත. ගාස්තු සහ අයකිරීමේ 'HSBC ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු ලේඛනය' හි ප්‍රකාශයට පත් කෙරෙන අතර, HSBC වෙබ් අඩවියෙන් හෝ ශාඛාවන් වෙතින් ලබාගත හැකිය | |
| **කාල තැන්පතු සහ ඉතුරුම් සැලසුම් සඳහා වන පොළී අනුපාතිකයන්** | • ඉතුරුම් සහ කාල තැන්පතු ගිණුම් (විදේශ ව්‍යවහාර මුදල්/දේශීය ව්‍යවහාර මුදල්) සඳහා වූ පොළී අනුපාතික පූර්ව දැනුම්දීමකින් තොරව වෙනස්වීමට විෂය වේ. කෙසේ වෙතත් පවත්නා කාල තැන්පතු මත ගිවිස ගනු ලැබූ පොළී අනුපාතික කල් පිරෙන තෙක් අප විසින් වෙනස් කරනු නොලැබේ | |
| **ණය සහ සියලු වත්කම් සැලසුම් සඳහා වන පොළී අනුපාතිකයන්** | • සියලු ණය සැලසුම් සඳහා වන පොළී අනුපාතිකයන් වෙළඳපොල පොළී අනුපාතිකයන්ට අනුව බැංකු විසින් තීරණය කරනු ලබන පරිදි කලින් කලට වෙනස්වීම්වලට විෂය වේ. අපගේ පරිශ්‍රයන් හි සහ/හෝ HSBC පොදු වෙබ් අඩවියේ සහ/හෝ ලිපියක් මඟින් සහ/හෝ ප්‍රකාශන පණිවුඩයක් මඟින් සහ/හෝ වෙනත් සුදුසු ඕනෑම ආකාරයකට ප්‍රදර්ශනය කිරීම මඟින් එවැනි පොළී අනුපතිකයන්ගේ වෙනස්වීම් ඔබට දැනුම් දෙනු ඇත. | |
| **ඔබේ තොරතුරු භාවිතය** | • කිසියම් සේවාවක් ඔබ වෙත සැපයීම සලකා බැලීමට හැකිවන පරිදි ඔබගේ පුද්ගලික තොරතුරු කලින් කලට අප වෙත සැපයීමට ඔබට සිදුවනු ඇත. පුද්ගලික තොරතුරු සඳහා ප්‍රවේශවීමට හා නිවැරදි කිරීමට ඉල්ලා සිටීමේ අයිතිය ඔබ සතු වන අතර, සෘජු අලෙවිකරණ කටයුතු සඳහා ඔබගේ පුද්ගලික තොරතුරු භාවිත නොකරන ලෙසට ඉල්ලා සිටීමට ද හැකිය | |
| **ඔබේ ගිණුමට හර කිරීමට; හිලව් කිරීමට අපට ඇති අයිතිය** | ඔබ වෙත පූර්ව දැනුම්දීමකින් තොරව පහත සඳහන් කටයුතු කිරීමේ අයිතිය අප සතුය:<br>• අප වෙත ඔබ විසින් ගෙවිය යුතුව ඇති ඕනෑම මුදලක් අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකින් හර කිරීමට;<br>• අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම හෝ සියලුම ගිණුම්වල ශේෂයන් රඳවා තබාගැනීමට, සංයුක්ත කිරීමට, ඒකාබද්ධ කිරීමට සහ එවැනි ගිණුම්වල බැර වී පවතින යම් මුදලක් හෝ ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව පවතින (ඔබ විසින් වෙන් වෙන්ව හෝ හවුලේ පැවතිය ද) මුදලක් එකී වගකීම් සත්‍ය හෝ අහඹු වුවද, වර්තමාන හෝ අනාගත වුවද, පියවීම හෝ මාරුකිරීම ද සිදුකළ හැක; සහ<br>• අප වෙත ඔබ විසින් ගෙවිය යුතු යම් මුදලක් වේ නම් සහ ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව ඇති මුදල අප සමග ඔබ විසින් පවත්වාගෙන යන කිසියම් හෝ ඕනෑම ගිණුමක ඇති හර ශේෂයට වඩා වැඩිවන විට සහ නියමිතව ඇති විටෙක හෝ ඔබ ඉල්ලා සිටි විටෙක ඔබේ කිසියම් හෝ ඕනෑම ගිණුමක ඕනෑම ව්‍යවහාර මුදල් වර්ගයකින් බැරව පවතින ඕනෑම මුදලක් ගෙවීම ප්‍රතික්ෂෙප කිරීම. | |

# HSBC Advance

## කෙටි විස්තරය

| ප්‍රධාන නීති | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| සේවාවන් හෝ ගිණුම් අවසන් කිරීම | • එකඟ වනු ලබන යෝග්‍යතා සුදුසුකම් මාස තුනක් නොකඩවා ඔබ විසින් පවත්වාගෙන නොගිය විටෙක Advance තත්ත්වය යටතේ වන ඔබේ HSBC Advance ගිණුම් පැකේජය, සාමාන්‍ය බැංකුකරණ ගිණුමක් බවට හරවනු ලබන අතර, ගිණුම් හිමියා විසින් භුක්ති විඳින ලද පී්‍රමියර්  ගිණුම් පැකේජය ඒ අනුව අත්හිටුවනු ලැබේ | • සංකලිත ගිණුම් නීතිරීති සහ කොන්දේසි |
| නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම | • නීතිරීති සහ කොන්දේසි කලින් කලට වෙනස් කිරීම සඳහා වූ අයිතිය බැංකුව සතු වන අතර අපගේ පරිශ්‍රයන් හි, පොදු වෙබ් අඩවියෙහි හෝ අප විසින් සුදුසු යැයි තීරණය කරන ඕනෑම ආකාරයක් මගින් ඒ බව ඔබ වෙත දැනුම් දෙනු ලැබේ | |

## ඔබේ හඬ

ඔබේ අදහස් අප වෙත දැන්වීමට කැමැති නම්, කරුණාකර අප අමතන්න

තැපැල් ලිපිනය : කළමනාකරු පාරිභෝගික සේවා, සුළු පරිමාණ බෙදාහැරීම් සහ වත්කම් කළමනාකරණය, මධ්‍යස්ථානය, අංක 525, යුනියන් පෙදෙස, කොළඹ 02
පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් :+94 114 511 566
විද්‍යුත් තැපැල් : customersolutions@hsbc.com.lk
වෙබ් අඩවිය : www.hsbc.lk /advance

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය.  ඔම්බුඩ්ස්මන් වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ:

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය, 143ඒ, වජිර පාර, කොළඹ 5.
දුරකථන : 94 112 595 625
ෆැක්ස් : 94 112 595 624
විද්‍යුත් තැපැල : info@financialombudsman.lk
වෙබ් අඩවිය : www.financialombudsman.lk

- පූර්ණ සංකලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි සංකලිත ගිණුම් සඳහා ද අදාළ වේ.  මෙම වගුවෙහි දැක්වෙන්නේ දැනගැනීම සඳහා වන මූලික සැලසුම් සම්බන්ධ නීතිරීතිවල සාරාංශයක් පමණක් වන අතර, සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි මෙමඟින් ආවරණය වන බවක් අදහස් නොකෙරේ.  කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.
- මෙම ප්‍රධාන නීතිරීතිවල සාරාංශයෙහි ඉංග්‍රිසි සහ දමිළ පරිවර්තනයන් www.hsbc.lk වෙබ් අඩවියෙන් ද, මුද්‍රිත පිටපත් බැංකුවේ සියලු කාර්යාල සහ/හෝ ශාඛා කාර්යාවලින් ලබාගත හැක. මෙම ප්‍රධාන නීතිරීතිවල සාරාංශයෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතු බවට මම/අප සහතික වී එකඟව සිටියි.